# ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී - 2019

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල

මාර්ගෝපදේශකත්වය

සජිත් ප්‍රේමදාස

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය

උපදේශකත්වය

බර්නාඩ් වසන්ත

ලේකම්

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අධීක්ෂණය

එල්. එච්. රත්නසිරි

අතිරේක ලේකම්

සංස්කරණය

ඩී.සී. දසනායක
හර්ෂදා විලුම්තිලකවඩු
හර්ෂ රංගන පෙරේරා

සහාය සංස්කරණය

චන්දිකා රත්නායක
එම්. ජේ. ලක්ෂිකා
සමිත් දුලද පතිරණ
කම්බුගොඩගේ ප්‍රියශාන්ති

අක්ෂර සංයෝජනය

අනිලා මෙලානි
ජී.එල්. ප්‍රියන්ති
හර්ෂණී ශෝවනදෙණිය
නිලුමි රත්නායක
නුවන්ති පූර්ණිමා
වත්සලා හරිනි

## ඌව පළාතේ ආහාර සංස්කෘතිය හා බැඳුණු අප්‍රකට වට්ටෝරු කිහිපයක් පිළිබඳ සටහනක්

සංස්කෘතික වපසරිය (Cultural Area) මානව විද්‍යාව, භූගෝල විද්‍යාව සහ අනෙකුත් සමාජ විද්‍යාවන්ට අනුව මානව වංශ වපසරිය ලෙස ද හඳුන්වනු ලැබේ. මෙයින් අදහස් වන්නේ ස්වාධීන සමාජ කණ්ඩායමක් ලෙස පවතින මානව කොට්ඨාසයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ගති ලක්ෂණවලින් යුක්ත (Trait - Complex Manifest) භූගෝලීය ප්‍රදේශයකි. මෙය සංස්කෘතික වර්ගීකරණයේ දී භාවිතයට ගනු ලබන රාමුවකි. (Framwork) සංස්කෘතික වපසරියක් යනු ජීවන වෘත්තීන්ට අනුව සංස්කෘතිවලට නැඹුරුවීම යි. මෙම සංකල්පය ක්ලාර්ක් විස්ලර් (Clark Wissler) විසින් හඳුන්වා දෙනු ලැබී ය (Wissler, 1957:219,220).

මෙම ලිපියෙන් ඌව පළාතේ ඉහළ සහ පහළ ඌව සංස්කෘතික වපසරියට ආවේණික ආහාරය හා බැඳුණු සාම්ප්‍රදායික වට්ටෝරු විධි කිහිපයක් පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

ඌව පළාත නම් සංස්කෘතික වපසරිය, උතුරු අක්ෂාංශ 6 කලා 17 සහ අක්ෂාංශ 7 කලා 35 අතරත් නැගෙනහිර දේශාංශ 80 කලා 47 ත් 81 කලා 38 අතරත් භූගෝලීය වශයෙන් පිහිටා ඇත (Geography Information System, 2000). වෙල්ලස්ස යන නමින් ද ප්‍රචලිත ඌව, නැගෙනහිරින් සහ උතුරෙන් නැගෙනහිර පළාතත්, දකුණෙන් දකුණු පළාතත්, බස්නාහිරෙන් සබරගමු සහ මධ්‍යම පළාතත් මායිම් කොට පවතියි. ඌව පළාත බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත ය. මෙහි වර්ගඵලය කිලෝමීටර් 9,951 ක් වෙයි. ඌව පළාතේ වර්ෂාපතනය තීරණය කරන ස්වාභාවික සාධක ලෙස මෝසම්, සංවහන, සුළිසුළං වැනි පෙන්වා දිය හැකි ය. මෙකී පළාත මි. මී. 1250 සීමාවේ සිට මි. මී. 2000 වාර්ෂික වර්ෂාපතන කලාපයට අයත් ය. වර්ෂාපතන ව්‍යාප්තියේ දී ඌව පළාත බලවත් විවිධත්වයක් පෙන්වයි.

මෙසේ විවිධත්වයෙන් යුතු වර්ෂාපතනය, මිනිස් ක්‍රියාකාරකම් මෙන් ම වෘක්ෂලතා පද්ධතිය කෙරෙහි ද මහත් බලපෑමක් ඇති කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රදේශ අතුරින් වෘක්ෂලතාදියෙහි අධික ම විවිධත්වයක් දක්නට ලැබෙන්නේ ඌව ප්‍රදේශයේ ය. එසේ වීමට පදනම් ව ඇත්තේ එහි පවත්නා දේශගුණ සහ භූ විෂමතාවෙහි බලපෑම යි. (මද්දුමබණ්ඩාර, 1991:84).

ඌව පළාතේ භූගෝලීය පරිසර පද්ධතියෙහි ප්‍රධාන ජලායනයන කටයුතු සිදු වනුයේ කුඹුක්කන් ඔය, මැණික් ගඟ, කිරිඳි ඔය, වලවේ ගඟ, විල ඔය, හැඩ ඔය වැනි ගංගා ඔස්සේ ය. මෙම ගංගා ඔස්සේ අතීතයේ සිට ම වාරි ව්‍යාපාර රාශියක් ගොඩනැගී තිබේ. ඒ අතර ඇතිමලේ වැව, හඳපානාගල වැව, සොරබොර වැව ආදි විශාල වැව් ද යුදගනාව, කොටියාගල, තෙනගල්ලන්ද වැව

වැනි මධ්‍යම ප්‍රමාණයේ වැව් ද තණමල්විල, තෙලුල්ල වැව වැනි සුළු පරිමාණ වැව් ද ඌව පළාත පුරා විසිරී තිබේ. (Brohier, 1934:13-40).

ඌවේ නාම ප්‍රභවය ගැන පවත්නා පරිසර විද්‍යාත්මක, ජනශ්‍රැත්‍යාගත, සන්නිවේදන විද්‍යාත්මක සහ භාෂා විද්‍යාත්මක මත මෙන් ම වෙනත් බටහිර ලේඛකයන්ගේ (Queyroz) මත රාශියක් විග්‍රහයට ලක් කර නාවුල්ලේ ධම්මානන්ද හිමියන් විසින් එළඹෙනුයේ පරිසර විද්‍යාත්මක ව එළඹිය හැකි නිගමනයකට ය. එනම් තදින් සුළං හමනා හඬ පදනම් කරගෙන ඌව නාමය බිහි වූ බව යි. (ධම්මානන්ද හිමි, 1966:1-3). ඌවේ ඓතිහාසික ප්‍රවෘත්ති, වාර්තා, ජනශ්‍රැති, පාරිසරික හේතු සහ වෙනත් ප්‍රාමාණික මූලාශ්‍ර රාශියක් උපයෝගී කර ගනිමින් වි. වා. මු. තිලකසිරි බණ්ඩාර ඌවේ නාම ප්‍රභවය හුය එනම් හූ හෙවත් නූල් යන අරුතින් මතු කරගනියි. නූල්වල එකතුවකට හුය යන වචනය භාවිත ය. ඒ අනුව හුය යන්න මුල් කොටගෙන හූව ශබ්දය හඳුනාගත හැකි යැයි බණ්ඩාර අදහස් කරයි (බණ්ඩාර, 1991:37).

ඌවේ පැරැණි බැවහර නාමය ජනකවියේ එන්නේ මෙසේ ය. ඒ අනුව විසිදහස් රට ලෙස ඌව හඳුන්වා ඇත්තේ ගම්, නියම්ගම්, පටුනු විසිදහසක් ඌවට අයත් වූ හෙයිනි.

පැසුණු සස් වගින් යුත් කෙත් වත් ගහන
විසි දහස් ගම් නියම් ගම් පටුනු යුතු වන
පුරවිලස් පැවැති මේ ඌවට සුරන
විසිදහස් රටය නම වීය පැරැණි දින (වීරසූරිය, 1980:80).

මෙසේ භෞතික සහ අභෞතික සාධක රාශියකින් සමන්විත ඌව පළාත එකී පළාතට ආවේණික මානව සංස්කෘතිකාංග රාශියකින් ද පොහොසත් ය. දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ අනෙක් ප්‍රදේශවලින් වෙන් ව තිබීම මෙන් ම ගමනාගමන අපහසුතා කරුණු හේතුවෙන් ඒ පළාතට ම ආවේණික වූ මානව ක්‍රියාකාරකම් ද ඌව පළාතෙහි රැකී තිබෙනු දැකිය හැකි ය.

ඌව පළාතේ පමණක් නො වසමස්ත ලංකාව ම බක් මාසයෙහි සමරන සිංහල අවුරුදු උත්සවය විශේෂයෙන් ආහාරය හා සම්බන්ධ ප්‍රකට දිනදර්ශනානුසාරී චාරිත්‍රයකි. මෙම අධ්‍යයනයෙන් අවධාරණ කරනුයේ ඌව පළාතේ සිංහල අවුරුද්දානුබද්ධ පූර්ව සහ අපර චාරිත්‍රද්වයක් පිළිබඳ ව යි.

පෙරදිග මිනිසා සහ ස්වභාවධර්මය අතර පවත්නා සම්බන්ධතාව ප්‍රායෝගික සහ ගෞරවණීය ආකාරයෙන් විශද වන චාරිත්‍ර විධියක් ලෙස සිංහල අවුරුදු උත්සවය හැඳින්විය හැකිය. ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ජාතික උත්සවවලින් එකක් වන මෙය පෘථිවියේ පරිභ්‍රමණය අනුව සූර්යයා

මුදුන්වීම සලකාගෙන ගොඩනගා ගෙන තිබේ. සූර්යයාගේ මුදුන්වීම ද චන්ද්‍ර ගමන ද අනුව පිළියෙල වූ නැකත් පද්ධතියකට අනුකූලව මෙම චාරිත්‍රවාරිත්‍ර සිදුවෙයි. සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට පිවිසීමේ අවස්ථාව එනම් පෘථිවිය සූර්යයා වටා එක් වටයක් ගොස් නැවත ගමන ආරම්භ කිරීමේ අවස්ථාව ජ්‍යොතිෂයට අනුව සංක්‍රාන්තියකි.

මෙසේ ජ්‍යොතිෂයට අනුව මීන රාශියෙන් අවසන් වන රාශී චක්‍රයෙහි ගමන නැවත මේෂයට පැමිණීම පෘථිවි ගමනෙහි නව ආරම්භයක් සේ සලකා තිබේ. එය සිංහල ජනකවියා ද මෙසේ විවරණය කරයි.

බක් මහ ලත් මේසය යන රුසටා - සක්රජ ලෙස දිවසළු හැඳ තොසටා

සෙත් ආසිරි සලසා සව් සතටා - නික්මෙයි සූරිය දෙව් මේ ලෙසටා

(සෝමානන්ද, 1986:700).

අලුත් අවුරුද්ද යනුවෙන් අප අදහස් කරන්නේ කාලය බෙදා වෙන් කර ගැනීමෙන් අනතුරුව එක් නියමිත කාලයක අවසානය හා ආරම්භය සනිටුහන් කර ගැනීමයි. වර්තමාන ලෝක ව්‍යවහාර ක්‍රමය අනුව එය සිදුකරන්නේ දින තිහකින් පිරි මාසයක් දොළොස් වතාවක් පසු කළ පසු එළඹෙන අවසානය හා ඊළඟ ආරම්භය වර්ෂයක අවසානය හා අලුත් අවුරුද්දක ආරම්භය වශයෙන් සැලකීමෙනි. (සෙනෙවිරත්න, 2007).

මෙසේ ශ්‍රී ලංකාවෙන් සුවිසල් වපසරියක විහිදෙන ඌව පළාතෙහි විවිධ ප්‍රදේශවල සුවිශේෂ චාරිත්‍ර දැකිය හැකි ය. ඌව පළාතේ ම ප්‍රදේශ දෙකක පවත්නා ආහාරය හා බැඳුණු චාරිත්‍ර දෙකක් ලෙස කඩක්කට්ටු පිරිනැමීමේ චාරිත්‍රය සහ ඉසෝදන මංගල්‍යය චාරිත්‍රය හඳුන්වා දිය හැකි ය.

ඕනෑම සමාජයකට සංස්කෘතියක් හිමි බව සමාජ විද්‍යාඥයෝ පෙන්වා දෙති. ඒ අනුව සංස්කෘතිය මගින් කිසියම් නිශ්චිත සමාජ භූමිකාවකට අදාළ හැසිරීම් සුවිශේෂ රාමුවකට අනුව හැඩගස්වනු ලබන බව ද පෙන්වා දෙයි. පවුල වැනි සමාජ සංස්ථාවල පැවැත්ම තහවුරු වී ඇත්තේ එකී ආයතනවලට සම්බන්ධ කර ඇති සුවිශේෂ සමාජීය භූමිකා මාර්ගයෙනි. මේ අනුව මව, පියා, දුව, පුතා, සහෝදරයා, සහෝදරිය යනාදි වශයෙන් වූ භූමිකා රැසක් පවුල නමැති සමාජ සංස්ථාව සමග සම්බන්ධ කොට ඇත (ජයසිංහ, 2013:117).

මෙහි පවත්නා මානව සහ සමාජ විද්‍යාත්මක අර්ථය සුවිශේෂ ය. මෙම චාරිත්‍රය පවුලේ වැඩිමහලු සහෝදරයා සිය භූමිකාවෙහි පිහිටා සුජීවත්ව සිටින පවුලේ අනෙක් සාමාජිකයන් වෙනුවෙන් සිදුකරනු ලබන ආහාර සම්බන්ධ චාරිත්‍රයකි. මෙහි දී ආහාරය ම විශේෂ කොට සලකා ඇත්තේ සිංහල අවුරුදු චාරිත්‍රයම සශ්‍රීකත්වය පිළිබඳ චාරිත්‍රයක් වන හෙයින්. මේ එහි එක් අංගයකි.